# ධර්මදූත විද්‍යාලය - බදුල්ල

## ප්‍රථම වාර පරීක්ෂණය - 2017

## ඉතිහාසය.

6 ශ්‍රේණිය කාලය -: පැය 02යි.

**1 කොටස**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ඉතිහාසය ගැන දැන ගැනීමට උපකාරී වන දේ හඳුන්වන නම,
1. විශ්වය 11. මූලාශ්‍ර 111. ඒකක 1V. මිනුම

(2) ඉතිහාසය ගැන තොරතුරු ලියැවුණු ග්‍රන්ථයක් වන්නේ,
1. විද්‍යා ප්‍රබන්ධ 11. මහා වංශය 111. ශබ්ද කෝෂය 1V. ජාතක කථා

(3) හින්දු දින දර්ශන වල බහුලව දක්නට ලැබෙන්නේ,
1. ශක වර්ෂ 11. හිජ්රි වර්ෂ 111. ක්‍රිස්තු වර්ෂ 1V. බුද්ධ වර්ෂ

(4) බුද්ධ පරිනිර්වාණය සිදු වුයේ ක්‍රිස්තු පූර්ව
1. 611 11. 544 111. 244 1V. 818

(5) පුරා විද්‍යාත්මක මුලාශ්‍රයක් නොවන්නේ,
1. මුරගල 11. දීප වංශය 111. ඇටසැකිලි 1V. ගොඩනැගිලි

- **නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(6) ඉතිහාසය යනු................................කාලයකි. ( කෙටි / දිගු / අනාගත )

(7) ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ ..........................................ලියා ඇත.
( මහා වංශය / දීපවංශය / පූජාවලිය )

(8) අතීතයේ ජීවත් වූ මිනිසුන් පරිහරණය කර දැනට ඉතිරි වී තිබෙන ද්‍රව්‍ය ................................................මුලාශ්‍ර වේ. ( සාහිත්‍ය / පූරාවිද්‍යාත්මක / සෞන්දර්යාත්මක )

(9) හිජ්රි වර්ෂ ආරම්භ වන්නේ ක්‍රිස්තු වර්ෂ .......................................( 422දී / 622දී / 544දී )

(10) පොළොව හාරා අතීතයට අයත් දේ සෙවීම ..................................කැණීම් නමින් හැඳින්වේ.
( දේශපාලනික / පුරාවිද්‍යාත්මක / ජීව විද්‍යාත්මක )

- **පහත ප්‍රකාශ සත්‍ය නම් √ ලකුණ ද අසත්‍ය නම් x ලකුණ ද ප්‍රකාශය ඉදිරියේ වරහන් තුළ යොදන්න.**

(11) අතීතයේ අප ජීවත් නොවූ කාලයේ සිදුවීම් අපට දැන ගැනිමට ක්‍රමයක් නැත. (   )

(12) දීපවංශය රචනා කළේ මහා විහාරවාසී මහානාම හිමිය. (   )

(13) ශ්‍රී ලංකාව නිදහස ලැබුවේ ක්‍රිස්තු වර්ෂ 1948 දීය. (   )

(14) ඉන්දී ගෞතමී පුත්‍ර සාතකර්ණී රජු ශක වර්ෂ ක්‍රමය ආරම්භ කළේය. (   )

(15) අතීතය ගැන කියවෙන කථා ශ්‍රී ලංකා ඉතිහාසයේ හමුවේ. (   )

- **පහත A තීරුවේ ප්‍රකාශයට ගැළපෙන වාක්‍ය කණ්ඩය B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (16) | ඉතිහාසය යනු ගෙවී ගිය කාලය ආපසු හැරි බලා | *මෙරට මහසෙන් රජුගේ කාලයයි. |
| (17) | ඉස්ලාම් ආගමේ නායකයා වූ මහමමන්තුමා මක්කම සිට මදීනා නගරයට පැමිණියේය. | *පුරා විද්‍යාත්මක කැනිම් වලදී හමුවේ. |
| (18) | ආදිවාසින් ජීවත් වූ ස්ථාන වල පහසුවෙන් දිරි නොයන දේ | *බුද්ධ වර්ෂ 611දීය. |
| (19) | ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියෙන් අවුරුදු දෙසීය හැත්තෑ හතරක් ගෙවී ගිය පසු | *වර්තමානයේ අපට මුහුණදීමට සිදු වන ගැටලු විසදා ගැනීමට මහපෙන්වීමක් ලැබේ. |
| (20) | වසභ රජුගේ රාජ්‍ය කාලය ආරම්භ වූයේ. | *ක්‍රිස්තු වර්ෂ 622දීය. |

( ලකුණු 20x2 =40)

## 11 කොටස

- **සපයා ඇති ප්‍රශ්න අතරින් ප්‍රශ්න 05ක් තෝරාගෙන පිළිතුරු ලියන්න.**

1) 1. අපට ඉතිහාසය ගැන දැනගත හැකි ක්‍රම 02ක් ලියන්න.
   11. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වලට නිදසුන් 02ක් ලියන්න.
   111.ගල් වල අක්ෂර සටහන් කළ ලිපිවර්ගය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 12යි)

2) 1. පැරණි රජවරුන් රාජ සභාවේ හිඳගත් ආසනය හඳුන්වන නම කුමක්ද?
   11. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා රාජ සභාවේ හිඳගත් ආසනය දැනට සුරක්ෂිතව තිබෙන ස්ථානය කුමක්ද?
   111.ඔබේ පාසලේ ඉතිහාසය දැන ගත හැකි ක්‍රම 02ක් ලියන්න. (ලකුණු 12යි)

3) 1. දීපවංශය රචනා වූ සියවස සඳහන් කරන්න.
   11. මහා වංශය රචනා කළේ කවුද?
   111.පොළොන්නරුවේ ගල් විහාරය ඉදි කර වූ රජු නම් කරන්න. (ලකුණු 12යි)

4) 1. ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු වර්ෂය ක්‍රිස්තු වර්ෂ ක්‍රමයෙන් දක්වන්න.
   11. බුදුන් වහන්සේගේ පරිනිර්වාණය සිදු වූ වර්ෂය ක්‍රිස්තු පූර්ව වර්ෂ ක්‍රමයෙන් දක්වන්න.
   111.ක්‍රිස්තුස් වහන්සේගේ උත්පත්තිය සිදු වූ වර්ෂය ක්‍රිස්තු වර්ෂ ක්‍රමයෙන් දක්වන්න.
   (ලකුණු 12යි)

5) 1. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රයෝජන 03ක් ලියන්න.
   11. ඉතිහාසයෙන් කාලය මැන ගන්නා සුලබ වශයෙන් භාවිතා කරන ක්‍රම 02 මොනවාද?
   111.පුරාණ කාලයේ ශ්‍රී ලංකාවට " පෙරදිග ධාන්‍යාගාරය " නැමති විරුදාවලිය භාවිතා කිරීමට හේතුව කුමක්ද? (ලකුණු 12යි)

6) 1. අතීතයේ සිදු දේය අවසන් වී ඇතැත් ඒවා මගින් දෙන පණිවිඩය වර්තමාන පරපුරට වැදගත් වන්නේ කුමක් නිසාද?
   11. ශ්‍රී ලංකාවේ අකුරු ලිවීම පිළිබඳ කෙතරම් ඉතිහාසයක් පැවතියේද?
   111.මෙරට ඉතිහාසය දැන ගැනීමට උපකාරි වන වෙනත් රටවල ග්‍රන්ථ මොනවාද?
   (ලකුණු 12යි)